# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1557/14 - 2008 ජූලි 09 වැනි බදාදා - 2008.07.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 4/81.

### 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23ඒ සහ 23ඔ යන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 32 වන වගන්තිය යටතේ පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

පාඨලී චම්පික රණවක,
පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍ය.

2008 ජූලි මස 07 වැනි දින,
කොළඹ දීය.

නියෝග

2003 ජූනි මස 30 වන දින අංක 1295/11 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2003 අංක 1 දරන ජාතික පරිසර (වායු විමෝචන, ඉන්ධන හා වාහන ආනයන ප්‍රමිති) නියෝග වල පළමුවන උපලේඛනය වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කිරීමෙන් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**"පළමුවන උපලේඛනය**

අ: පෙට්‍රල් වාහනඃ-

| *වාහන වර්ගය* | විමෝචන ප්‍රමිති<br>*2008 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි*<br>කාබන් මොනොක්සයිඩ්<br>CO(%v/v) | <br><br>හයිඩ්‍රොකාබන්<br>HC(ppmv/v) | *වෙනත් කරුණු* |
|---|---|---|---|
| මෝටර් බයිසිකල් මෝටර් ට්‍රයිසිකල් හැර වෙනත් පෙට්‍රල් වාහන | 4.5 | 1200 | පණගන්වා ධාවනය නොකර සහ 2500 RPM බර නොපටවා |
| පෙට්‍රල් මෝටර් බයිසිකල් සහ පෙට්‍රල් මෝටර් ට්‍රයිසිකල් | 6 | 9000 | |

සංක්ෂිප්ත ලකුණු:
%v/v - පරිමාව අනුව ප්‍රතිශතය
ppm v/v - පරිමාව අනුව මිලියනයකට කොටස්
RPM - මිනිත්තුවකට වට

ආ: ඩීසල් වාහනඃ-

| වාහන වර්ගය | විමෝචන ප්‍රමිති |
|---|---|
| | ක්ෂණික ත්වරණයේදී (වේගය වැඩි කිරීමේ දී) ධූම පාරාන්ධතාවය K සාධකය ($m^{-1}$)<br>(2008 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි) |
| ඩීසල් වාහන | 8.0 |

සංක්ෂිප්ත ලකුණු

K සාධකය - අවශෝෂක සංගුණකය
ක්ෂණික ත්වරණය - SAE RECOMMENDED PRACTICE J 1667 යන යෙදුමෙහි අර්ථකථනයෙහි ඇති අර්ථයම ඇත.

07-601

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.